නාගරික සංවර්ධන අධිකාරිය

# තිරසර පුරවර

ත්‍රෛමාසික පුවත් සඟරාව

02 වෙළුම | 2017 ජුලි - සැප්තැම්බර් කලාපය

## ප්‍රධාන පුවත්

### කඩුවෙලින් ආරම්භ වන සැහැල්ලු දුම්රිය සේවයක්

- කඩුවෙලට විධිමත් නාගරික සංවර්ධනයක්.
- රාජ්‍ය ආයතන සියල්ල බත්තරමුල්ලට.
- මහවැලි ව්‍යාපාරය මෙන් කැළණි ගඟ ව්‍යාපාරය වත්මනට අත්‍යාවශ්‍යයි.

බස්නාහිර පළාත සීඝ්‍රයෙන් නාගරීකරණය වීමත් සමග කොළඹ නගරයේ මිනිසුන්ට පදිංචිවීමට හැකි ඉඩම් පහසුකම් නොමැති වීම හේතුව නිසාත්, එහි වාණිජ වටිනාකම ඉතාම සීඝ්‍රයෙන් ඉහළ යාම නිසාත්, ජනතාව පදිංචිවීම සඳහා පැමිණෙන ප්‍රදේශ ලෙස මෙම කඩුවෙල, හෝමාගම ආදී ප්‍රදේශ හැඳින්විය හැකියි. එහිදී විධිමත් නාගරීකරණයක් මෙම ප්‍රදේශවලට අවශ්‍යවන නිසා විධිමත් වැඩපිළිවෙලක් කඩුවෙලට සකස් කර ආණ්ඩුව වෙත ඉදිරිපත් කර තිබේ. එහි ප්‍රධාන අංගයන් ලෙස කඩුවෙල නගර සංවර්ධනය කිරීම, චන්ද්‍රිකා කුමාරණතුංග මාවත සංවර්ධනය කිරීම, කොලොන්නාව ආසනයේ මුල්ලේරියාව වැව අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම, අතුරුගිරිය ප්‍රදේශයේ නව නගරයක් මෙන්ම විනෝදාස්වාද ප්‍රදේශයක් ඉදිරිකිරීමට ද කටයුතු කෙරෙමින් පවතී. මාලබේ නව නගර නිර්මාණයත්, කඩුවෙල පාර්ලිමේන්තු ප්‍රධාන මාර්ගයේ පවතින දැඩි මාර්ග තදබදයට විසඳුම් ලෙස රජය විසින් ජපන් රජය සමග සාකච්ඡා කර සැහැල්ලු දුම්රිය සේවයක් පිටකොටුව දක්වා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා. මේ වනවිට එහි ශක්‍යතා අධ්‍යනය සිදුකරමින් තිබෙන අතර, ඉඩම් අත්පත් කර ගැනීමත් සිදුවෙමින් පවතිනවා. ලබන වසර අගභාගයේදී එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතයි.

බත්තරමුල්ල සෙත්සිරිපාය අසළ ප්‍රදේශයේ අතිරේක මාර්ගයක් නාගරික සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව ඉදිකරමින් පවතිනවා. එහි පළමු කොටස පසුගියදා විවෘත කරනු ලැබුවා. බත්තරමුල්ල ප්‍රධාන ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ටෙන්ඩර්පත් මේ වසරේදී කැඳවීමට කටයුතු කරනු ඇති.



............6 වැනි පිටුවට

## බත්තරමුල්ල පරිපාලන නගරය තුළ රජයේ කාර්යාලයන් සඳහා සුනම්‍ය වේලාවක්.

### නියමු ව්‍යාපෘතිය සැප්. 18 වෙනිදා සිට ක්‍රියාත්මකයි

- අමාත්‍ය
පාඨලී චම්පික රණවක




- ඉදිරි වසර 03 ඇතුළතදී තවත් රාජ්‍ය ආයතන 113 ක් බත්තරමුල්ල පරිපාලන නගරයට
- වාහන තදබදය හඳුනා ගැනීමට ජංගම දුරකතනයට ක්ලවුඩ් ඇප් එකක්..

**අමාත්‍යවරයා මෙම අදහස් පළකර සිටියේ, රජයේ කාර්යාල සඳහා සුනම්‍ය වේලාවන් හඳුන්වාදීම පිළිබඳව මාධ්‍ය හමුවකට සහභාගී වෙමිනි. මෙම මාධ්‍ය හමුව බත්තරමුල්ල සුහුරුපායේ පිහිටි මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පැවැත්වුණු අතර මෙම අවස්ථාවට අමාත්‍යාංශ ලේකම් ඉංජිනේරු නිහාල් රූපසිංහ මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.**

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරයා, 'මාර්ග තදබදයට විසඳුමක් ලෙස පසුගිය රජය අනුගමනය කළ උපාය මාර්ගය තමයි මාර්ග පද්ධති, පාලම් පද්ධති, ගුවන් පාලම් වැනි දේ වැඩි වැඩියෙන් ඉදිකිරීම. ඒ මඟින් ප්‍රවාහන සඳහා යන කාලය අවම කර ගැනීම තමයි උත්සාහය වූයේ. ඒ සඳහා රාජ්‍ය අරමුදල් විශාල ලෙස වැය කළා. 2005 සිට 2014 දක්වා කාලය තුළ ආසන්නයෙන් මාර්ග පද්ධති සඳහා ලංකාවේ ප්‍රාග්ධන වියදමින් 45% ක්, එනම් බිලියන 1000 කට අධික ප්‍රමාණයක් අපි වියදම් කර තිබෙනවා. ලංකාවේ ණය බරෙන් ආසන්නයෙන් 40% ක් වැය වෙන්නේ මාර්ග හදන්න ගත්ත ණය වලට. මාර්ගවල දියුණුවක් ඇති වුණා, ඒවයින් යම්කිසි විදිහකට සංක්‍රමණික රටාවන්වලට පහසුවක් ඇතිවුනා. නමුත් නාගරිකව මාර්ග තදබදය පිළිබඳව තිබූ තත්වයේ වෙනසක් ඇති වුනේ නැහැ.

එනිසා අපේ අමාත්‍යාංශය මගින් වෙනත් උපාය මාර්ගයක් යෝජනා කළා. මෙතරම් අධික වියදමක් දරමින් මාර්ග පද්ධති අධිවේගී මාර්ග පද්ධති වෙනුවට පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කරන්න කියලා. දිනකට මාර්ග තදබදය නිසා ඉන්ධන සහ කාලය අහිමිවීම ලෙස රුපියල් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් මහමග නාස්ති වෙන බව අප කලිනුත් සඳහන් කර තිබෙනවා. වසරකට පෞද්ගලික වාහන හා අමතර කොටස් ගෙන ඒම සඳහා රුපියල් බිලියන 200 කට අධික ප්‍රමාණයක් වැයවනවා. රටේ ණය බරයි, වෙළෙඳ ශේෂයයි පිළිබඳව කල්පනා කර බැලූවහොත්. ඒ සඳහා අප යෝජනා කළා බස්රථ සහ දුම්රිය ඉදිරියට ගෙනයාම ඉතා අවශ්‍ය බවට.

එසේම, මාර්ගවල තදබදය අවම කර ගැනීම සඳහා පෞද්ගලික වාහන කළමනාකරණයක් කරගත හොත් මෙන්ම, පොදු බස් සේවාව වැඩිදියුණු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග විශාල පහසුවක් වන බවට අපට පෙනී ගියා. ඒ නිසා තමයි විශාල දෙනෙකුගේ අමනාපකම් මැද බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමය හඳුන්වා දුන්නේ. එමඟින්, ආසන්න වශයෙන් පොදු ප්‍රවාහනය භාවිත කළ අයට එම මාර්ගවල කාල ඉතුරුවක් ලැබී තිබෙනවා සේම 20% කින් පමණ වේගය වැඩි වී තිබෙනවා එම ක්ෂේත්‍රවල. යම් කිසි ගැටළුවක් ඇති වී තිබෙන්නේ පාර්ලිමේන්තු මාර්ගයේ පමණයි. එයට ප්‍රධාන හේතුව රාජගිරියේ සිදුවන ඉදිකිරීම් කටයුතු නිසයි.

ඊළඟ පියවර ලෙස බත්තරමුල්ල ප්‍රදේශයේ පමණක් කාර්යාල වේලාවන් වෙනස් කිරීමට.

............. 2 වැනි පිටුවට

## බත්තරමුල්ල පරිපාලන නගරය...

..........1 වැනි පිටුවෙන්

මෙය බත්තරමුල්ල ප්‍රදේශයේ තිබෙන රාජ්‍ය ආයතන සඳහා පමණක් නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා. පිටකොටුවටත් වඩා වැඩිම මාර්ග තදබදයක් තිබෙන බත්තරමුල්ල ප්‍රදේශයේ රාජ්‍ය ආයතන 41 ක් තිබෙන අතර ඒ තුළ අඩුම තරමින් රාජ්‍ය සේවකයින් 6,000 කට අධික ප්‍රමාණයක් සේවය කරනවා සේම, සේවා ලබාගැනීම සඳහා විශාල ප්‍රමාණයක් පැමිණෙනවා. ඒ වගේම ඉදිරි වසර 3 දී බත්තරමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට තවත් රාජ්‍ය ආයතන 113 ක් අප හඳුනාගෙන තිබෙනවා. එවිට තවත් මෙහි තදබදය වැඩිවනවා. එම නිසා අප විසින් මූලික කාලවේලාවක් ලෙස 09.15 සිට 3.15 දක්වා වේලාව හඳුනා ගත්තා. ඒ වගේම 7.30 සිට 5.00 දක්වා සේවකයින්ට ඒ ඒ විදිහට තමන්ට අවශ්‍ය අයුරින් රාජකාරී සඳහා වාර්තා කිරීමට හැකියාව තිබෙනවා. එහිදී 9.15 සිට 3.15 දක්වා අනිවාර්යයෙන්ම කාර්යාලයේ රැඳී සිටිය යුතුයි. තමන්ට සුදුසු අයුරින් මෙය වෙනස් කර ගත හැකිය. මෙම වැඩපිළිවෙල නිවැරදි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි වුවහොත්, මෙමගින් ලැබෙන ප්‍රතිඵලය ඉතාම වැදගත්.

මේ වන විට අපි ඉතාම විධිමත් ලෙස අධ්‍යනය කර තිබෙනවා තදබදය උච්චම අවස්ථාවේදී කොතරම් වාහන ප්‍රමාණයක් එක් මංතීරුවක ධාවනය වනවාද යන්නත්, එම වාහනයන් හි ධාවන කාලය කොපමණ ද යන්නත්, සොයා බැලීමේදී පැයකට වාහන 1,450 ක් තරම් අධික ප්‍රමාණයක් මාර්ගය තුළ හිරවී තිබෙන අතර, එම වාහනයන් ධාවන කාලය පැයට කිලෝමීටර් 10ක තරම් අඩු අගයක් ගනු ලබනවා. ඒ අනුව මෙම වාහන ප්‍රමාණය පැයකදී වාහන 250 ක් මාර්ගයට එක්වීම නවතා ගතහොත් අපට වාහන ධාවනය වන කාලය පැයට කිලෝමීටර් 20 දක්වා වැඩිකරගත හැකි වෙනවා. සුනම්‍ය වේලාවක් අපේ නියමු ව්‍යාපෘතියක් වගේම පර්යේෂණයක්. එහි ප්‍රතිඵල අපි නිරන්තරයෙන්ම සොයා බලමින් නිසියාකාරව අධ්‍යනය කර විද්‍යානුකූල සැලැස්මක් ඉදිරිපත් කිරීම මෙම ව්‍යාපෘතිය ඉවහල් කර ගන්නවා.

> **"අන්තර්ජාලය භාවිත කර වාහන තදබදය ගැටළුව විසඳා ගැනීමට ක්ලවුඩ් ඇප් එකක් "**

ඊළඟ පියවර ලෙස අන්තර්ජාලය භාවිත කර වාහන තදබදය ගැටළුව විසඳා ගැනීමට නිශ්චිත වේලාවකට පුද්ගලයාව පාරට ගනු ලබන වැඩසටහනකට ගමන් කිරීම වගේම ක්ලවුඩ් ඇප් එකක් ජංගම දුරකථනයට හඳුන්වාදීමට අපි කටයුතු කරනවා. එහි නියමු ව්‍යාපෘතියක් ජනාධිපති කාර්යාලය මඟින් මහනුවර සිදු කරනු ලැබුවා. එමගින් ලද අත්දැකීම් මත. මොරටුව විශ්ව විද්‍යාලය නවෝත්පාදනයේ නියැලී සිටින තරුණ නවෝත්පාදකයෝ ගණනාවක් මඟින් මේ පිළිබඳව වැදගත් නිර්මාණ ගණනාවක් ලබාදී තිබෙනවා. ඒවාත් යොදාගෙන මෙය හඳුන්වා දීමට බලාපොරොත්තු වෙනවා. මේ වසර අවසන්වන විට අප පොදු ප්‍රවාහන සේවයේ වෙනසක් බලාපොරොත්තු වෙනවා.

## 2018-2022 සඳහා උපාය මාර්ගික සැලසුම



සංවිධානයක ඉදිරි දැක්ම සැලසුම් කිරීමේදී ඒ සඳහා බෙහෙවින් උපකාර වන්නේ අරමුණු හා පරමාර්ථයි. එම නිසා අරමුණු හා පරමාර්ථ සංවිධානය දැක්මට අනුකූලව නිර්මාණය කිරීම සිදු කරයි.

එලෙසින්ම නාගරික සංවර්ධන අධිකාරියේද දැක්මට අනුව පරමාර්ථ ස්ථාපිත කර ඇති අතර, ඒවා ළඟාකර ගැනීම සඳහා ඉදිරි වර්ෂ 5 ක කාල සීමාව සඳහා ආයතනය මඟින් කල යුතු ප්‍රධාන කාර්යයන් උපාය මාර්ග සැලසුම් මගින් ඉදිරිපත් වේ. මෙහිදී මුල් පියවර ලෙස ආයතන ප්‍රධාන කාර්යයන් හඳුනා ගැනීමක් සිදු කෙරෙන අතර ඒ සඳහා ලොව පිළිගත් සම්මත ක්‍රමයක් උපයෝගී කර ගනිමින් ආයතන තුළ වූ ශක්තීන් දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගනිමින් ඒවාට නිසි සැලසුම් නිර්මාණය කරමින් ආයතනික අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම සිදුවේ.



වෘත්තීය ප්‍රවීනයන්ගේ සැදුම්ලත් නිලධර මඩුල්ලකින් සමන්විත මෙම ආයතනය තුළින් මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින් හඳුනාගත් ව්‍යාපෘති මෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් හඳුනා ගන්නා නාගරික ව්‍යාපෘති රැසක්ද නිර්මාණය කර ඇත.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය මඟින් කෙරෙන විශේෂ කාර්යක් ලෙස රටේ අභිවෘද්ධිය උදෙසා දේශීය මෙන්ම විදේශීය ආයෝජනයන් අභිප්‍රේරණය කර ඉදිරි සැලසුම් නිර්මාණය කිරීමක් සිදු කරන ලදී. එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියට සම්බන්ධ පාර්ශවයන් ගෙන්ද ඉදිරි වසර 5 සඳහා නිර්මාණය වන උපාය මාර්ගික සැලැස්ම සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීමක් 2017 ජූලි 25 වන දින සිදු කරන ලදී.

ඒ හා සමගාමීව දෙවන අදියර ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර පාරිභෝගිකයින්/නිලධාරීන්ගේ අදහස් හා යෝජනා තව දුරටත් විශ්ලේෂණය කිරීම සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික මැතිතුමාගේ සහභාගිත්වයෙන් 2017 අගෝස්තු 11,12 හා 13 දිනයන්හි වැඩමුළුවක් පවත්වන ලදී.

ඉන්පසු එම අදහස් හා යෝජනා මත නිර්මාණය වූ දළ පිටපත පිළිබඳ නව අදහස් ගෙන වීම හා උපායමාර්ගික සැලැස්ම සම්මත කර ගැනීම සඳහා 2017 සැප්තැම්බර් 12,19 සහ 26 යන දිනයන්හි සාකච්ඡා වැඩමුළු කිහිපයක් පැවැත්වීමට සූදානම් කර ඇත.

එමගින් ලබා ගන්නා අදහස් හා යෝජනා සියල්ල විශ්ලේෂණය කරමින් නිසි අවබෝධයකින් යුතුව උපායමාර්ග සැලැස්ම නිර්මාණය කිරීම සිදුකරයි. එමෙන්ම නිර්මාණය වන මෙම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිසි බලතල හා සම්පත් ලබා දිය යුතු අතර එම එක් එක් කාර්යයන් සඳහා නිසි බලධාරීන් ද යොමු කල යුතුය. නැතහොත් මෙම උපායමාර්ගික සැලැස්මද හුදෙක්ම කොලවලට සීමා වුවක් වීම වලකා ලිය නොහැක.

එමෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ එක් එක් අංශ සඳහා වූ කාර්යය සාධක ඇගයීම් ක්‍රියාමාර්ගයක්ද උපාය මාර්ග සැලසුමෙහි අන්තර්ගත වන අතර එමඟින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුවන සියළු කාර්යයන් පිළිබඳ නිසි ඇගයීමක් සිදු කරනු ලැබේ. ඒ වගේම මෙමගින් එම කාර්යයන්හි විචලනයවීම් හඳුනාගෙන එහි ඇති පසුබෑම් තත්වයන්හට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ ඉහළ කළමනාකාරිත්වය විසින් සාකච්ඡාවට ගෙන නිසි විසඳුම් ලබාදී එම කාර්යයන් සාර්ථක කර ගනිමින් ඉදිරි ඉලක්කයන් නිසිලෙස ඉටුකරගැනීමට නිසි ලෙස මඟ පෙන්වා දෙන්නා වූ ආයතනික උපායමාර්ගික සැලැස්මක් නිර්මාණය කිරීම සිදුවේ.

**සංවිධානයක ඉදිරි දැක්ම සැලසුම් කිරීමේදී ඒ සඳහා බෙහෙවින් උපකාර වන්නේ අරමුණු හා පරමාර්ථයි. එම නිසා අරමුණු හා පරමාර්ථ සංවිධානය දැක්මට අනුකූලව නිර්මාණය කිරීම සිදු කරයි.**

# සංස්කාරක සටහන !

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය තුලින් පරිසරයත් මිනිසාත් වනසන ඩයොක්සින් මාරයා පිටු දකිමු!

ස්වභාදහම විසින් මිනිසාටත් සත්වයන්ටත් ලබා දී ඇති පිරිසිදු පරිසරය සුරැකීම ඔබගේත් මගේත් යුතුකමයි. සතුන් ශාක මෙන්ම මිනිසාද පරිසරයට අපද්‍රව්‍ය මුදාහරින අතර, ඒවා ක්‍රමවත්ව බැහැර කෙරේ නම් පරිසරයට වන හානිය අවම වනු ඇත.

නමුත් එසේ නොකිරීම එනම් අක්‍රමවත්ව ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා ස්වභාවික පරිසරය හා (සම්පත්) ජනජීවිතයට මහත් හානියක් මිනිසුන් විසින්ම සිදු කරමින් පවතී.

මේ තුලින් පරිසර දුෂණය, ජල දුෂණය  හා වාතය දුෂණය වීම සිදු වේ. මෙහිදී ඉතා වැදගත් වන්නේ ඩයොක්සින් ක්‍රියාවලියයි. "ඩයොක්සීන්" යනුවෙන් හදුන්වනු ලබන්නේ පොලිතින්, ප්ලාස්ටික්, එස්ලෝන් වැනි මුලික ද්‍රව්‍ය හා එමඟින් නිශ්පාදිත අනෙකුත් ද්‍රව්‍ය හා කැලි කසල විවෘතව දහනය කිරීම නිසා ඇති වන වායුමය (රාසායනික) ප්‍රතිඵලයයි. වෙනත් ආකාරයකින් හදුන්වනු ලබන්නේ නම් නයිට්‍රජන්, ඔක්සිජන්, කාබන් හා ක්ලෝරීන් රාසායනික අඩංගු ද්‍රව්‍ය විවෘත පරිසරය තුළදී පිලිස්සීමෙන් ඇතිවන වායුමය ප්‍රතිඵලයකි.

ප්ලාස්ටික් හා පොලිතින් වැනි ද්‍රව්‍ය විවෘත භූමිතුල පිලිස්සීම බහුලව දැකිය හැකිය.මෙසේ විවෘත භූමි වල හෝ පුද්ගලිකව තමන්ගේ නිවෙස් අවට මෙකී ද්‍රව්‍ය දහනය කිරීම නිසා එහි අඩංගු වන දුෂිත වායුව අශ්වාස ප්‍රාශ්වාස කිරීම මඟින් මගින් ශරීරයට ඇතුල් වීමෙන් රෝගාබාධ ඇති වන අතර, ඉතා කුඩා දූවිලි අංශු වල ඇති ඩයොක්සීන් වායුව තැම්පත් වීමෙන් පස මෙන්ම පරිසරයද දුෂණය වේ. මෙම ඩයොක්සීන් රාසායනිකය නිසා මානව සම්පතට ඇති විය හැකි රෝගාබාධ වශයෙන් පිළිකා සෛල වර්ධනය, විවිධ රෝගාබාධ සහිත දරුවන් බිහි වීම, කුඩා දරුවන්ගේ ඉගෙනීමේ කටයුතු වල දුර්වලතාවයන් ඇති වීම ආදීය හැදින්විය හැකිය.

මෙම ඩයොක්සීන් ශරීරගත වීමෙන් ඇතිවන ව්‍යසනයන්ගෙන් අපත් මතු පරපුරත් බේරා ගැනීමට අප කල යුත්තේ කුමක්ද?

- මෙම රසායනය උත්පාදනය වන ප්‍රධාන කාරණයක් වන පොලිතීන්, ප්ලාස්ටික් , එස්ලෝන් වලින් නිශ්පාදිත හා අනෙකුත් ඝන අපද්‍රව්‍ය පිලිස්සීම නතර කිරීම.
- මෙම ප්‍රධාන ප්‍රභවයන් භාවිතය හැකි පමණ අවම කිරීම.
- මෙම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණයට දායක වීම.
- මේවා වැඩි වාර ගණනක් භාවිතයට පුරුදු වීම.
- මෙම  ද්‍රව්‍ය සදහා විකල්ප අමු ද්‍රව්‍ය වලින් නිශ්පාදිත බෑග් හා ඇසුරුම් උපකරණ භාවිතයට යොමු වීම.

ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා අපද්‍රව්‍ය වර්ග කිරීමට අප පසුබට නොවී ක්‍රියාත්මක විය යුතුය. ඒ අනුව අප නිවෙස්වල, අප කාර්යාල තුළ, වෙළඳ ව්‍යාපාර තුළ, කර්මාන්තශාලා වල හා සේවා මධ්‍යස්ථාන වල කඩදාසි, කාබනික, ලෝහ, වීදුරු සහ ප්ලාස්ටික් වශයෙන් අපද්‍රව්‍ය වර්ග කර ගබඩා කර තබා ගැනීමටත් ඒවා රැස් කරන තැන් හෝ මිළ දී ගන්නා ආයතන වෙත යොමු කිරීමටත් පුරුදු විය යුතුය. ඒ සඳහා ප්‍රජාව උනන්දු කරවීමට පළාත් පාලන ආයතන, ප්‍රජා සංවිධාන හා රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාත්මක විය යුතුය.


# පිබිදෙමු පොළොන්නරුව

## රජරට නවෝදය ජනපති වැඩසටහන

### "පිබිදෙමු පොළොන්නරුව" නගර සංවර්ධන ව්‍යාපෘතිය

රජරට නවෝදය ජනපති වැඩසටහන, පිබිදෙමු පොළොන්නරුව නගර සංවර්ධන වැඩසටහන යටතේ පොළොන්නරුව නගරය සීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතී. එහිදී නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සංවර්ධන වැඩසටහන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරමින් පවතී. මේ අතර මාර්ග, ජල හා අපරව්‍යුහ පහසුකම් සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. තවද පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම, රජයේ සේවකයින්ගේ නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම හා ජාතික වකුගඩු විශේෂඥ රෝහල ඉදිකිරීම ආදී ව්‍යාපෘති මේ වන විටත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. සංචාරක තොරතුරු මධ්‍යස්ථානය හා සංචාරක පහසුකම් මධ්‍යස්ථානය (සති පොළ) ආදී ව්‍යාපෘති මේ වන විටත් වැඩ අවසන් කර තිබෙන අතර, මහජනයාගේ පොදු විනෝදාස්වාද පහසුකම් සම්පූර්ණ කරමින් **"දීප උයන"** මහජනයා අතට පත් කරන ලදී. කදුරුවෙල නගරයේ කෘෂි ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම (රු.මි.5,200) සඳහා මුල්ගල තැබීම ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිදුන්ගේ සුරතින් 2017.09.07 වන දින සිදු කරන ලදී.



## "තිරසර පුරවර" පුවත් සඟරාව මංගල කළාපය



නාගරික සංවර්ධන අධිකාරියේ තිරසර පුරවර පුවත් සඟරාවේ මංගල කළාපය ගරු මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමන් වෙත නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන් විසින් පිළිගන්වනු ලැබූ මොහොත...



# UDA දිනපොතෙන්

## සැප්තැම්බර් 28

නිවාස 300 කින් සමන්විත කොට්ටාව, කුලසෙවන වත්ත (වියත්පුර) මධ්‍යම පාන්තික මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීමේ සමාරම්භක උත්සවය ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වින.

## සැප්තැම්බර් 15

අතිගරු ජනාධිපතිතුමන්ගේ "පුනරුදය" පරිසර සංරක්ෂණ වැඩසටහන යටතේ,මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන්, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සකස් කළ, "නීල හරිත ශ්‍රී ලංකා" ශ්‍රී ලංකාවේ ගොඩනැඟිලි වල හරිත ප්‍රමිතීන් ඇගයීමේ ජාතික ක්‍රමවේදයට අනුව,මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් නව ගොඩනැඟිල්ල,"සොබාදම් පියස"සඳහා "රාජ්‍ය හරිත රන් සම්මානය" උත්සවාකාරයෙන් ලබා දුනි

## සැප්තැම්බර් 12

දක්ෂිණ කලාපීය මහනගර සංවර්ධන සැලසුමට අනුව ඉදිවන බෙරලිහෙල පොළ ඉදිකිරීම් ආරම්භය මහා නගර අමාත්‍ය චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. මෙම ව්‍යාපෘතිය 2018 වසරේදී අවසන් කිරීමට නියමිතය. මහනගර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත නාගරික සංවර්ධන අධිකාරිය මෙහි ඉදිකිරීම් සිදු කරනු ලබයි. රුපියල් මිලියන 43.2 ක මුදලක් මේ සඳහා වැය කිරීමට නියමිතය.

## සැප්තැම්බර් 9

රුපියල් මිලියන 145ක වියදමින් නිමාකරන ලද කඩුවෙල සතිපොළ හා අතිරේක බස් පර්යන්තය ජනතා අයිතියට පිරිනමන ලදී.

## අගෝස්තු 29

මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන මහනගර සැලසුමේ වත්මන් තත්ත්වය සහ ප්‍රගතිය පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය,ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඇතුළු අමාත්‍යංශය මගින් පරිපාලනය වන ආයතනවල සේවකයින් දැනුවත් කිරීමේ හමුව අමාත්‍යංශ ලේකම් ඉංජිනේරු නිහාල් රූපසිංහ සහ මහා නගර අතිරේක ලේකම් මාධව වෛද්‍යරත්න යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

## අගෝස්තු 24

පිටකොටුව එක්සත් වෙළඳ සංගමය සංවිධානය කළ ජාත්‍යන්තර අහාර පාන ප්‍රදර්ශනය සහ අලෙවි පොළ මහානගර ඇමති චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඇරඹිණි

## අගෝස්තු 17

කසළින් විදුලිය නිපදවීමේ වැඩසටහනේ තුන්වන ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භය අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මහනගර ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ සහභාගිත්වයෙන් කරදියාන කසළ අංගනයේදී සිදුවිය

## අගෝස්තු 11

නාගරික සංවර්ධන අධිකාරියේ 2018 සිට 2022 වසර දක්වා උපාය මාර්ගික සැලසුම පිළිබඳව අදහස් හා යෝජනා ලබාගනිමින් ඒ පිළිබඳව නිරීක්ෂණය කරමින් සාකච්චා කිරීම මහනගර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් "ඕෂන් විව්" හෝටලයේදී පැවැත්වින

## අගෝස්තු 10

රජයේ පූර්ණ අනුග්‍රහය හා යටතේ පෞද්ගලික ආයතන 2ක් රුපියල් බිලියන 27 ක ආයෝජනයකින් මෙගා වොට් 20 ක  කසලින් විදුලිය උපදවන ශ්‍රිලංකාවේ පළමු ව්‍යාපෘති දෙකෙහි ඉදිකිරීම් ආරම්භය අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කෙරවලපිටියේ දී ආරම්භ විය

## අගෝස්තු 01

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ උපදේශකත්වයෙන් රුපියල් ලක්ෂ 1400ක වියදමින්, නාගරික සංවර්ධන අධිකාරිය මගින් මහනුවර ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයේ ඉදි කරන ලද ඇත්ගාල ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අවසන් කර ශ්‍රී දළදා මාළිගාව වෙත පූජා කිරීම

## ජූලි 31

නාගරික සංවර්ධන අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලයීය ගොඩනැගිලි පහසුකම් පුළුල් කර එය සේවා කටයුතු සඳහා විවෘත කිරීම මහනගර අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවිය.

## ජූලි 23

හපුතලේ නැරඹුම් මධ්‍යස්ථානය ජනතා අයිතියට පත් කිරීම අද දින මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා අතින් සිදු විය. රුපියල් මිලියන 40ක වියදමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින්මෙ ම නැරඹුම් මධ්‍යස්ථානය ඉදිකරන ලදී.



## ජූලි 21

බදුල්ල සති පොළ ජනතා අයිතියට පත්කිරීම සිදුවිය. ඒ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙනි.

## ජූලි 21

රුපියල් ලක්ෂ 300 ක වියදමින් සංවර්ධනය කරන ලද ඇල්ල දුම්රිය චතුරශ්‍රය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනතා අයිතියට පැවරිණි

ජූලි 25



## කතරගම ව්‍යාපාරිකයින්ට නව කඩ කාමර රැසක්.

කතරගම සංවර්ධන සැලසුම යටතේ කඩ කාමර 69ක් මහජනතාව වෙත ප්‍රධානය කිරීම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය. මෙම අවස්ථාවට කතරගම ප්‍රාදේශීය සම්බන්ධීක-රණ කමිටුවේ සම සභාපති පාර්ලිමේතු මන්ත්‍රී ආනන්ද කුමාරසිරි. මහතා ඇතුළු විශාල පිරිසක් මේ අවස්ථාවට සහභාගී විය

## ජූලි 31

නාගරික මහල් නිවාස වල ජීවත්වන ළමුන්ගේ කුසලතාවයෙන් පැවැත්වෙන ලෝක ළමා දින ප්‍රසංගය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම සහ දරුවන් ඒ සඳහා ලියාපදිංචි කිරීම බස්නාහිර පළාත් සංස්කෘතික නිකේතනයේදී සිදු විය.

## ජූලි 25

සෙල්ල කතරගම මහජන උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

## ජූලි 23

රුපියල් මිලියන 200ක වියදමින් බදුල්ල නගරයේ ඉදිවන වාණිජ සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය නිරීක්ෂණය කිරීමේ චාරිකාවකට මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා එක්විය

## ජූලි 17

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වෘත්තීයවේදීන් සඳහා ආරම්භ කළ 'වියත්පුර' නිවාස යෝජනා ක්‍රමය පන්නිපිටිය වීරමාවතේ, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ සහභාගීත්වයෙන් ආරම්භ කෙරුණි.

## ජූලි 04

නාගරික සංවර්ධන අධිකාරිය මගින් එළිදක්වනු ලැබූ තිරසර පුරවර මංගල කලාපය මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතාට පිළිගැන්වීය.

## ජූලි 02

තඹුත්තේගම කාර්යාල හා වෙළඳ සංකීර්ණයට මුල්ගල තැබීම මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ සහභාගීත්වයෙන් ආරම්භ විය.

# නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

## නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ ප්‍රගතිය

කොළඹ නගරය ආශ්‍රිත අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි පදිංචි ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් සහ ඔවුන් විසින් භාවිතය සඳහා යොදාගෙන ඇති රජය සතු ඉඩම් නිදහස් කරගෙන ප්‍රශස්ථ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමේ අරමුණින් 2010 වර්ෂයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මෙම ව්‍යාපෘතිය මඟින් 2010 හා 2011 වර්ෂයේ සිදු කරනු ලැබූ මූලික සමීක්ෂණයේදී කොළඹ අගනගරය තුළ අඩු පහසුකම් සහිත පවුල් 68,0000 ක් හඳුනාගෙන ඇති අතර අක්කර 900 ක වපසරියක එම ජනාවාස ව්‍යාප්ත වී පවතින බව හඳුනාගෙන ඇත.

මේ අනුව, මේ වන විට මහල් නිවාස සංකීර්ණ 13 ක පදිංචිකරුවන් 6000 කට ආසන්න ප්‍රමාණයක් පදිංචි කිරීමට නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට හැකියාව ලැබී ඇති අතර 2017 වර්ෂය තුළ තවත් මහල් නිවාස සංකීර්ණ 05 ක නිවාස ඒකක 6000 කට වැඩි ප්‍රමාණයක් ජනතා අයිතියට පත් කිරීමට සැලසුම් කර ඇත.

කොළඹ නගරය ආශ්‍රිතව රජය සතු ඉඩම් තුළ අඩු පහසුකම් සහිතව පදිංචි වී සිටින ස්ථිර පදිංචිකරුවන් මෙම විකල්ප නිවාස ලබා ගැනීමට සුදුසුකම් ලබයි. මේ අනුව මෙම



මේ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් නිවාසලාභීන් තෝරාපත් කර ගැනීමේ මූලික අදියර ලෙස අදාළ ජනාවාසයෙහි ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු සිදු කරනු ලබන අතර නිවාසලාභීන් තෝරාපත් කර ගැනීමේදී ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කරනු ලබන අවස්ථාවේදී භෞතික ලෙස භූමිය තුළ නිවසක් පැවතීම අනිවාර්යය වේ.

### අඩු ආදායම් ලාභී නිවාස ලබා දීමේ ප්‍රතිපත්තිය .........

මීට අමතරව නිවාසලාභීන් තෝරාපත් කර ගැනීමේදී මූලික වශයෙන් මෙම අධිකාරිය විසින් 2011 වර්ෂයේ සිදු කරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණයේදී අදාළ ගෘහ අංකය යටතේ ගෘහ මූලිකයාගේ නම ඇතුළත් වී තිබිය යුතු අතර 2008/2009/2010 වර්ෂයන්හි ඡන්දය මඟින් අදාළ ඉල්ලුම්කරු එම නිවස තුළ ස්ථිර ලෙස පදිංචිවී සිටින බව තහවුරු වී තිබිය යුතුය. මීට අමතරව නිවසේ වත්මන් පදිංචිය තහවුරු කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය, පොලිස් වාර්තාව, ජල/විදුලි බිල්පත්, කුටුම්භ කාඩ්පත ආදී ලිපි ලේඛන පරීක්ෂා කිරීම සිදු කරනු ලබයි.

මෙම සුදුසුකම් සපුරාලන පදිංචිකරුවන් විකල්ප නිවාස ලබා ගැනීමට සුදුසුකම් ලබන අතර සුදුසුකම් සපුරා නොමැති පදිංචිකරුවන් අභියාචනා කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කමිටුවේ නිර්දේශ මත නිවාස ලබා දීමට කටයුතු කරනු ලබයි. එසේ තෝරාපත් කර ගන්නා ලද නිවාසලාභීන් හට කුසපත් ඇදීමෙන් පසු අදාළ නිවාසයන්හි යතුරු බාරදෙනු ලැබේ.

තවද, ඔවුන්ගේ අවශ්‍යතා තවදුරටත් හඳුනාගෙන මෙම නිවැසියන්ගේ සුභසාධනය වෙනුවෙන් අවශ්‍ය ඉදිරි සැලසුම් සකස් කිරීම මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරමින් පවතී.

## නිවසක් සමඟ ජීවිතයක්...නව පදිංචි කරුවන්ට නව ජීවනයක්...



photo credit- worldbank.org

> එම වැඩපිළිවෙල යටතේ සියළු මහල් නිවාසවල ප්‍රජා ශාලාවක්, අධ්‍යාපන වැඩසටහන් සඳහා ශාලාවක්, පෙර පාසලක් මහල් නිවාස තුළටම ඇතුළත් කිරීමට පියවර ගන්නා ලදී.

නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් අඩු පහසුකම් සහ වරප්‍රසාද සහිත අනවසර පදිංචිකරුවන් හා කොළඹ නගරයේ වතුවල ජීවත්වන ප්‍රජාව එම වතුවලින් සහ රජයේ පොදු ඉඩම් වලින් ඉවත්කර මහල් නිවාසවල පදිංචි කරවීම වසරක කීපයක සිට කරගෙන යයි. ඒ අනුව නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් මහල් නිවාස ව්‍යාපෘතිවල නිවසක් ලබාදෙයි. මෙම ක්‍රියාවලිය වසර 04 කට අධික කාලයක සිට ක්‍රියාත්මක වුව ද එම ප්‍රජාවගේ සමාජ ගැටළු විසඳීමට ක්‍රමවේදයක් නොතිබිණි.

නිවසක් ලබාදීමෙන් පමණක් එම සංකීර්ණ ගැටළු විසඳෙන්නේ නැත. මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කර මහානගර හා බස්නාහිර සංවර්ධන ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා උක්ත සමාජ ගැටළුව විසඳීම සඳහා විශේෂ ඒකකයක් මඟින් පුළුල් අධ්‍යාපන වැඩපිළිවෙලක් 2015 වසරේ දී දියත් කරන ලදී.

එම වැඩපිළිවෙල යටතේ සියළු මහල් නිවාසවල ප්‍රජා ශාලාවක්, අධ්‍යාපන වැඩසටහන් සඳහා ශාලාවක්, පෙර පාසලක් මහල් නිවාස තුළටම ඇතුළත් කිරීමට පියවර ගන්නා ලදී.

අනතුරුව පාසල් නොයන පාසල් යන වයසේ දරුවන් පාසලට යොමු කිරීම, විශේෂ උපකාරක පන්ති පවත්වා අධ්‍යාපනයට කැමැත්තක්, උනන්දුවක් ඇති කිරීම මූලික වශයෙන් ආරම්භ කරන ලදී. ඒ සඳහා ගුරුවරුන් 20 දෙනෙකුගේ සේවය මේ වන විට ලබාගනී.

ඔවුනට ද නිරන්තර පුහුණුවක් ලබාදෙනුයේ මෙම ප්‍රජාව අධ්‍යාපන අරමුණු වෙත යොමුකර ගැනීම එතරම් පහසු ක්‍රියාවක් නොවන නිසාය. එසේම යහපත් ජීවිත අපේක්ෂා ගොඩනැගීම සඳහා අධ්‍යාපන වැඩසටහන්වලට අමතරව අභිප්‍රේරණ ක්‍රියාකාරකම් ද මේ වන විට සිදුකරගෙන යනු ලබයි.

මෙම මහල් නිවාසවල තරුණ තරුණියන්ට හා තරුණ මව්වරුන්ට විශේෂ ස්වයං රැකියා පුහුණුවක් ද ලබාදෙනු ලැබේ. ආර්ථික පසුබිම ශක්තිමත් කර ගැනීමට මෙම පුහුණුව ඔවුනට ඉතා ප්‍රයෝජනවත් අතර නාගරික මහල් නිවාස වල ජීවත්වන රැකියා නොකරන පිරිස සරළව යම් සේවා නියුක්තියකට යොමු කිරීමට එම ක්‍රියාවලිය වැදගත්වී ඇත. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විද්‍යා හා තාක්ෂණ නිළධාරීන් මේ සඳහා විශේෂ උනන්දුවකින් අප සමඟ සම්බන්ධ වී කටයුතු කරන බව ද මෙහි දී පෙන්වා දිය යුතුය.

............6 වැනි පිටුවට

## නිවසක් සමඟ ජීවිතයක්...

............5 වැනි පිටුවෙන්

එසේම ක්‍රීඩා කුසලතා දියුණු කිරීම සඳහා වාර්ෂිකව ක්‍රීඩා උත්සව කීපයක් සංවිධානය කිරීම ද සිදුවේ.

**සමාජයට සංස්කෘතික මිනිසෙකු දායාද කිරීම අරමුණු කොට ගෙන එහි ජීවත් වන දරුවන්ට කලාව, සාහිත්‍ය වැනි ක්ෂේත්‍රවලට උනන්දුවක් ඇති කිරීම, කලා රසඥතාව දියුණු කිරීම අරමුණු කර "රිද්ම සැරිය" කලා ප්‍රසංගය, ඉංග්‍රීසි දින වැඩසටහන සහ ලෝක ළමා දින වැඩසටහන, වැඩි දරුවන් පිරිසක් සහභාගී කරගෙන බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2017 ඔක්තෝබර් මස 01 දින ප.ව.3.00 ට රඟ දක්වනු ලැබේ.**

මෙම දරුවන් බොහෝවිට නගරයේ කුඩා පාසල්වල අඩු පහසුකම් සහිතව අධ්‍යාපන කටයුතු කරනු දැකිය හැකිය. එම දරුවන්ට විශේෂ සම්පත්දායකයින්, කුසලතා පිරි ගුරුවරුන් සම්බන්ධ කරගෙන ඔවුන්ගේ කුසලතා දියුණු කිරීම පුළුල් කාර්යභාරයක් නාගරික සංවර්ධන අධිකාරියේ, උපදේශන අංශයෙන් මේ වන විට සිදුකරගෙන යන බව ඉතා සතුටින් සඳහන් කළ යුතුය.

නාගරික මහල් නිවාස ආශ්‍රිතව ව්‍යවසනයක්ව ව්‍යාප්ත වන මත්ද්‍රව්‍ය උවදුරින් තරුණ ජීවත බේරා ගැනීම සඳහා ක්‍රියාත්මක වැඩසටහන් ද මේ අතර වේ.

මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ කිසිඳු මුදලක් ලබා නොගන්නා අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සමාගම් විසින් අනුග්‍රාහක දායකත්වය ලබාදෙනු ලැබේ. මෙම ප්‍රජා සංවර්ධන වැඩසටහන් සාර්ථකව කරගෙන යෑම සඳහා ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමන්, නියෝජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න මැතිතුමාත් විසින් දෙනු ලබන උපදේශකත්වයත්, ගරු සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ අධීක්ෂණය සහ නාගරික පුනර්ජීවන ඒකකයේ අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන සහයෝගයන් කෘතවේදීව සිහිපත් කරමු.

ප්‍රජා සංවර්ධන උපදේශක මණ්ඩලය කිත්සිරි ආනන්ද (අධ්‍යාපන උපදේශක), සුනිමල් ජනරංජන (ක්‍රීඩා හා සෞන්දර්ය), චන්දිම ලියනආරච්චි (ස්වයං රැකියා හා වෘත්තීය පුහුණු) මෙම ක්‍රියාකාරිකම බල ගැන්විමෙලා උපදේශකත්වය සපයනු ලබති.

## මොකක්ද මේ KPI

ඕනෑම ආයතනයක, ව්‍යාපාරයක, පැවැත්මට සහ ප්‍රවර්ධනයට තිබිය යුතු වැදගත්ම කාර්යභාරය වන්නේ එම ආයතනය හෝ ව්‍යාපාරයක තම ඉලක්ක සපුරාගෙන තිබේද යන්න මාසිකව විමසා බැලීමයි. එමඟින් අදාළ ඉලක්ක කරා ළඟාවී ඇති දෙපාර්තමේන්තු හඳුනාගත හැකි අතර, එම තොරතුරු විශ්ලේශනය මත කළමණාකාරීත්වයට ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා තීරණ ගැනීමට පහසුකම් සලසනු ඇත. නාගරික සංවර්ධන අධිකාරියද තම කාර්යාල ව්‍යුහය තුල ඒ ඒ දෙපාර්තමේන්තු, උප කාර්යාල අදාළ වර්ෂය සඳහා සකසා ගත් ඉලක්ක සපුරා ඇත්ද යන්න පසුවිපරම් කිරීම සඳහා කාර්යසාධන දර්ශකය KPI භාවිතය 2016 වර්ශයේ ආරම්භ කරන ලදී.

එහෙත් මෙම වැඩසටහන නියමු වැඩසටහනක් ලෙස එම වසර තුල ක්‍රියාත්මකව 2017 වසරේදී අධිකාරියේ සියලුම අංශ ආවරණය වන පරිදි කාර්යසාධන දර්ශකය මෙම ක්‍රමය යටතේ මැනබැලීම සිදුවිය.

ආයතනයේ සමස්ත සඵලදායිතාවය මේ අනුව මාසිකව ඇගයිමට ලක්වන අතර, එහිදී ඒ ඒ අංශ තම ඉලක්ක සපුරාගෙන නැතිනම් ඊට හේතු හඳුනාගෙන විසඳුම් සෙවීම හා කාර්යසාධන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා තීරණ ගැනීම ඉහළ කළමණාකාරීත්වය කටයුතු යොදා ඇත.

අධ්‍යක්ෂකවරයා යටතේ මෙම කාර්යසාධන ඇගයීම් ඒකකය සෘජුවම කටයුතු කරන අතර ඒ ඒ අංශයන්ගේ මූලික ඉලක්ක සැපුරුම් ක්‍රමය සඳහා ලකුණු ක්‍රමයක් නිර්මාණය කර ඇත.

| | |
|---|---|
| 0 - 69 | රතු ■ |
| 70 - 99 | කහ ■ |
| 100 - ඉහල | කොළ ■ |

යම් අංශයක් තම ඉලක්ක කරා ළඟා වී ඇති ආකාරය ඉහත ක්‍රමවේදය අනුව සලකුණු වන අතර මාසිකව පවත්වන කාර්යසාධන දර්ශක ඇගයීම් රැස්වීම් තුළදී විමර්ශනය කෙරෙනු ඇත. එහිදී ඊට හේතුවන කරුණු විමසා බලා ඊට සෘජු විසඳුම් යෝජනා කර ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම තුළින් පහත සඳහන් ක්‍රියාවලියන්හී කාර්යසාධනය වර්ෂය තුළ ඉහළ ප්‍රගතියක් ලබා ඇත.

- සංවර්ධන කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- සංවර්ධන සැලසුම් ඇගයීම සඳහා ඉලක්ක ගත ක්‍රමවේද සැකසීම.
- සැපයුම් ක්‍රියාවලිය විධිමත් කිරීම.


මෙම ක්‍රියාවලිය යාන්ත්‍රණය වීමත් සමඟ ආයතනය තුල එක් එක් දෙපාර්තමේන්තු තුල තිබූ රාජකාරීමය දුරස්ථභාවය අවම කර අන්‍යෝන්‍යය අවබෝධය හා මනා සංවිධානීකරණයක් යටතේ එක් එක් අංශ ඉහල සහයෝගයකින් කාර්යක්ෂමව ඉලක්ක සපුරා ගැනීම සිදුවෙමින් පවතී.

මෙම ක්‍රමවේදය අර්ධ වාර්ෂිකව සභාපතිතුමා හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන විශේෂ කමිටුවක් මඟින් පූර්ව විමර්ශනය කර පවත්නා අඩුපාඩු පිලිබඳව වාර්තාවක්ද ඉහල කළමණාකාරීත්වයට සපයනු ඇත.

මෙම ක්‍රමය තුළ යම් දෙපාර්තමේන්තුවක් තුළ දුර්වල ක්‍රියාකාරීත්වයක් ඇත්නම් හඳුනාගත හැකිවීම මෙන්ම යම් අංශයක් කාර්යසාධන ක්‍රියාවලිය තුළ ඉහළ අගයක් තබාගනිමින් ඉහළ සේවාවක් සපයයි නම් එම අංශ හා නිලධාරින් ඇගයිම සඳහා ද කටයුතු සිදුකල හැකිවීම සමස්ථ සේවකයන්ගේ තෘප්තිමත් බවට හේතුවක්ද වන අතර නිලධාරීන්ගේ උසස්වීම් ක්‍රමවේදයේදී ද මෙම කාර්යසාධන දර්ශකය (KPI) වැදගත්වනු ඇත.

මෙම ක්‍රියාවලිය සාර්ථකවීම මත සමස්ත කාර්යමණ්ඩලයද තම තමන්ගේ කාර්යසාධනය ඉහළ නංවාගැනීමට නිතැතින්ම ස්වයංව කටයුතු කිරීමට මඟපෙන්වීමක්ද සිදුකරයි.

Overoll Performance Of UDA




## කඩුවෙලින් ආරම්භ වන...

.............1 වැනි පිටුවෙන්

පාර්ලිමේන්තුව අවට ප්‍රදේශය ස්වාධීන කොමිෂන් සභා, අග්‍රාමාත්‍ය කාර්යාලය ඇතුළු කාර්යාල ඉදිකිරීම සඳහා සැලසුමක් ඉදිරිපත් කර තිබෙනවා.

මාලබේ සිට හෝමාගම දක්වා ප්‍රදේශය තාක්ෂණ විශ්ව විද්‍යාල, තාක්ෂණ ආයතනය, විද්වතුන්ගේ පුරවරයක් බවට පරිවර්ථනය කරන්න බලාපොරොත්තු වන අතර, ඒ සඳහා දැනට ආයතන 16 ක් ස්ථාපිත කර තිබෙනවා. ඉදිරියේදී තවත් ආයතන ඒ සඳහා යොමුවීමට ඉඩ තිබෙන අතර නව යුගයක් මේ කලාපයට ඇති වන බව සඳහන් කළ යුතුයි.

තරඟකාරී ලෝක ආර්ථිකය යටතේ තවදුරටත් තේ, පොල්, රබර් මත ආර්ථිකය ගෙනයන්න බැහැ. අපට තවදුරටත් ඇඟලුම් කර්මාන්තය මත ආර්ථිකය ගෙන යා නොහැකියි, තාක්ෂණයත් නවෝත්පාදනයත් හරහා නව ගමනකට අප අවතීර්ණ යුතුයි. ඒ තුළින් ආර්ථිකය සවිබල ගැන්විය යුතුයි. ඒ සඳහා රජය විසින් තෝරාගෙන තිබෙන්නේ මාලබේ සිට හෝමාගම දක්වා ප්‍රදේශයයි.

මහවැලි ව්‍යාපාරය, වලවේ ව්‍යාපාරය මෙන්ම මෙරටට අත්‍යාවශ්‍යම ව්‍යාපාරය තමයි කැළණි ගඟ ව්‍යාපාරය. කැළණි ගඟ නිසිලෙස සංවර්ධනය කර කඩුවෙල සිට කොළඹ දක්වා විකල්ප මාර්ගයක් ගංඉවුර භාවිත කරමින් ඉදිකිරීමටත්, කැළණි ගඟේ ජල මට්ටම පාලනය කර කොළඹ වරායේ කුඩා නැව් කඩුවෙල දක්වා ගෙනවිත්, අධිවේගී මාර්ගයත් සමග ගාල්ල වරාය සහ හම්බන්තොට වරාය දක්වා සම්බන්ධ කිරීමට හැකි වන ලෙස මෙම කැළණි ගඟ ව්‍යපාරය ගොඩනැගිය යුතුයි. ඒ නිසා මෙම ව්‍යාපෘතිය රජය වෙත ඉදිරිපත් කළා. ඒ සඳහා ගරු ජනාධිපතිතුමාගෙත් අග්‍රාමාත්‍යතුමාගේත් ශක්තිය මේ සඳහා ලැබෙයි කියා බලාපොරොත්තු වෙනවා.


ඒ වගේම විද්වතුන්ට, වෘත්තීයවේදීන්ට නිවාස 50,000ක් ඉදිකිරීම් කටයුතු සිදු කරගෙන යන අතර පැල්පත්වාසීන්ට ද නිවාස 50,000 ක් ඉදිකරමින් පවතිනවා. එහි නිවාස 20,000 ක් මේ වන විට ඉදිකර අවසන් කර තිබෙනවා.

# බේරේ වැව එදා, අද සහ හෙට

බේරේ වැව අතීතයේ දී හෙක්ටයාර් 165 ක ප්‍රමාණයක පැතිරී තිබුණ අතර, ඒ අවට ප්‍රදේශය පහත් වගුරු බිමක් ලෙස පැවතුණි. කෙසේ වුවත් වරාය කේන්ද්‍ර කොට ගෙන කොළඹ නගරය වර්ධනය සඳහා බේරේ වැව විශාල වශයෙන් දායක වූ බවට සාක්ෂි අදටත් දැක ගත හැක. උදාහරණ ලෙස මැකලම් ගේට්ටුව හරහා බේරේ වැවෙහි ජල මට්ටම පාලනය කිරීම හා එම දොරටු හරහා භාණ්ඩ එහා මෙහා ගෙනගොස් ඇති බවට තොරතුරු ඇත. එසේම නැගෙනහිර බේරේ වැව දෙපස විශාල වශයෙන් වරාය අධිකාරියට අයත් ඉඩම් තිබීමත් ඒවායෙහි විශාල ගුදම් ඉදිකර තිබීමත් අදටත් දැකගත හැකිය. කෙසේ වුවත් අද වන විට බේරේ වැව හෙක්ටයාර් 65 දක්වා අඩු වී ඇති අතර, වරාය සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ ගුදම් අතහැර දමා ඇති ආකාරයත් ඒවායෙහි ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ විශේෂ කාර්ය බලකාය භාවිතා කරන ආකාරයත් අද දක්වා දැක ගත හැකිය.

කොළඹ නගරය අද තිබෙන ආකාරයට සංවර්ධනය වීමේ දී බේරේ වැව තම හැඩය ප්‍රමාණය සහ සුන්දරත්වය කොතරම් කැප කර තිබේදැයි ඉහත තොරතුරුවලට අනුව ඔබට වැටහෙනවා ඇත.

**බේරේ වැව ලන්දේසි යුගයේදී**



වසර ගණනාවක් පුරා බේරේ වැව ගොඩකරමින් ගුදම් ඉදිකිරීම, මාර්ග තැනීම, බෝට්ටු නැවතුම් ස්ථාන සහ බේරේ වැව තුළ අනවසර නිවාස ඉදිකිරීම දැකගත හැකිය.

1993 වසරේ කරන ලද අධ්‍යයනයකට අනුව බේරේ වැව අවට දක්නට ඇති නොගැලපෙන භාවිතයන් සහ අවිධිමත් බවත් හේතු කොටගෙන ඇල්ගී ඇතිවීම, කලින් කළට වැවෙහි මාළුන් මැරීයාම, ජලයෙහි පැහැය වෙනස් වීම සහ දුර්ගන්ධය පැතිරීම සිදුවන බව පෙන්වා දී ඇත. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ බේරේ වැව දෙපස ඇති අනවසර නිවාස සහ අනෙකුත් ගොඩනැගිලි මගින් සෘජුවම මළපහ වැවට යොමුකිරීම දැක ගත හැකිය. එසේම බේරේ වැව පෝෂක ප්‍රදේශය හරහා වැසි ජලය රැගෙන එන කානු මගින් වක්‍රාකාරයෙන් මළපහ වැවට යොමු කිරීම වාර්තා වන අතර, ඒවා වැසි ජලය බැසයාමට ඉදිකර ඇති කාණු හරහා වැවට යොමු කරයි.




ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් බේරේ වැව සහ ඒ අවට ඇති වටිනා ඉඩම් රටේ ආර්ථික දියුණුවට සහ කොළඹ නගරයේ දියුණුවට යොමු කර ගන්නා ආකාරයට 1993 බේරේ වැව මහ සැලසුම සකස් කර ඇත.

මෙහිදී කොළඹ නගරයට ජල මුහුණතක් (Water Front) ලබා දීමට සුදුසු භූමිභාග 15 ක් හඳුනාගන්නා ලදී.

එම යෝජනාව අනුව හමුදා මූලස්ථානය වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපිත කිරීම, කළම්බු කොමර්ෂල් ඉඩම නිදහස් කර ගැනීම, කොම්පඤ්ඤ වීදිය ප්‍රතිසංවර්ධනය කිරීමේ අදියර I සහ II ක්‍රියාත්මක කරන ලදී. වැව වටා සංවර්ධනය කිරීමද මේ යටතේ සිදුකළ අතර, දකුණු වැවෙහි ජලය පිරිසිදු කිරීම 2000/ 2001 වසරවල දී ක්‍රියාත්මක කරන ලදී. එදා සහ අද කරන ලද බේරේ වැව සංවර්ධනය කිරීමේ සැලසුම්වල ප්‍රධාන අරමුණු පහත පරිදි වේ

- බේරේ වැව වටා ඇති සියළුම ඉඩම් ඉහල ඵලදායීතාවකට දියුණු කිරීම
- බේරේ වැව අපවිත්‍රවන ආකාරයේ සියළු භාවිතයන් පාලනය කිරීම
- ස්වාභාවික පරිසරය ආරක්ෂා කර ගනිමින් යෝජිත සංවර්ධනය සැලසුම් කිරීම
- දේශීය හා විදේශීය ජනතාවට බේරේ වැව වෙත ලගාවීමට හැකිවන පරිදි වැව රක්ෂිතය විවෘත කර සංවර්ධනය කිරීම හා විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් දියුණු කිරීම
- විශේෂයෙන් දේශීය ජනතාව සඳහා තම ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමේ අවස්ථා වැඩිකිරීම හා ආර්ථික දියුණුව ඇති කිරීම

## බේරේ වැව සංවර්ධන සැලසුම 2017 - 2035

මෙම සැලසුම මගින් ප්‍රධාන කරුණු දෙකක් ඉටුකර ගැනීමට අපේක්ෂා කෙරේ

1. බේරේ වැව පිරිසිදු කර මහජනතාවගේ භාවිතයට සකස් කිරීම
2. බේරේ වැව වටා ඇති වටිනා ඉඩම් සැලසුම් සහගත ආකාරයට නාගරික සංවර්ධනයට යොදා ගැනීම හා එ තුලින් ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම

ඒ අනුව බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හඳුනා ගත් ප්‍රදේශයට විශේෂ කළාපීකරණ රෙගුලාසි සකස් කර ඇත.

ඉන්දියන් සාගරය, කොළඹ වරාය, වරාය නගරය, විහාර මහා දේවී උද්‍යානය සහ ගාලුමුවදොර ආවරණය වන ආකාරයට සංවර්ධන කොරිඩෝ පහක් (Five Finger Corridor) හඳුනාගෙන ඇති අතර, ඒ හරහා බේරේ වැවත් නගරයේ අනිකුත් ප්‍රදේශත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම විශේෂ සංවර්ධන කළාපය හෙක්ටයාර් 290 ක් පමණ වන අතර, ඉන් හෙක්ටයාර් 55 ක් පමණ බේරේ වැව ලෙස පවතී. එසේම හෙක්ටයාර් 30 ක පමණ රජයේ කාර්යාල පිහිටා ඇති අතර, හෙක්ටයාර් 27 ක් පමණ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් වේ. ඊට අමතරව හෙක්ටයාර් 26 ක් පමණ ගුදම් ලෙස පවතී. මින් වැඩි ප්‍රමාණයක් අයත් වනුයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියටය. මෙහි දී විශේෂයෙන් දැකගත හැකි වනුයේ නේවාසික භාවිතයට හෙක්ටයාර් 24 ක් පමණ වෙන් වී ඇති අතර, විවෘත ප්‍රදේශ ලෙස හෙක්ටයාර් 20 ක් පමණ වෙන් වී ඇති බවය.

විවෘත ප්‍රදේශ සහ විනෝද කටයුතු සඳහා සැලකිය යුතු භූමි ප්‍රදේශයක් වෙන්කිරීමටත්, එම ප්‍රදේශය දිවා කාලය මෙන්ම රාත්‍රී කාලයේ දී ද සජීවීව තබාගැනීම උදෙසා නේවාසික භාවිතය ද තෝරාගත් කළාප තුළ ප්‍රවර්ධනය කිරීමටත් මෙම සැලසුම තුලින් අපේක්ෂා කෙරේ.

එසේම මේ වන විටත් මෙම කළාපය තුළ හෙක්ටයාර් 19 ක් පමණ සංවර්ධන කටයුතු සඳහා නිදහස් කර ඇති අතර, ඒවායෙහි ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතී.




...........8 වැනි පිටුවට

## බේරේ වැව එදා, අද සහ හෙට...

...........7 වැනි පිටුවෙන්

නැගෙනහිර බේරේ වැවෙහි බටහිර ඉවුරෙහි අනවසර නිවාස 500 ක් පමණ දැකගත හැකි අතර, ඉන් සැලකිය යුතු නිවාස සංඛ්‍යාවක් බේරේ වැව තුළ ඉදිකර ඇත. උදාහරණ ලෙස 87 වත්ත සහ 175 වත්ත සැලකිය හැකිය.

බේරේ වැව සංවර්ධන සැලසුම යටතේ 2016 වසරේ රුපියල් මිලියන 1350 ක් රජය විසින් ලබා දුන් අතර, එම මුදල වැය කොට ඉහත සඳහන් නිවාස 384 ක් පමණ නාගරික පුණර්ජීවන ව්‍යාපෘතිය යටතේ නිමකල නිවාස ව්‍යාපෘතියක පදිංචි කරවීමට කටයුතු යොදා ඇත. එය මෙම වසරේ නොවැම්බර් මස වන විට ක්‍රියාත්මක කළ හැකි වනවා ඇත.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රුපියල් මිලියන 847 බටහිර බේරේ සහ නැගෙනහිර බේරේ නැගෙනහිර ඉවුර සංරක්ෂණය සදහා වැය කර ඇති අතර, තවත් රුපියල් මිලියන 620 ක් ජෛවීය උද්‍යාන සඳහා වෙන් කර ඇත. නැගෙනහිර බේරේ නැගෙනහිර කොටසෙහි ජෛවීය උද්‍යානයෙහි ඉදිකිරීම් කටයුතු මේ වසර අවසන් වන විට අවසන් කිරීමට යෝජිත අතර, බටහිර බේරේ බටහිර ඉවුරේ ජෛවීය උද්‍යානය 2018 වසර අවසන්වීමට ප්‍රථම අවසන් කිරීමට නියමිතය.

මීට අමතරව 2018 වසර සඳහා බේරේ වැව වටා ජෛවීය උද්‍යානය සම්පූර්ණ කිරීම සදහා රජයේ ප්‍රතිපාදන අපේක්ෂා කෙරේ.

2020 වන විට බේරේ වැව සහ ඒ වටා ඇති හදුනාගත් ඉඩම් නගර සංවර්ධනය සදහා යොදවා ගැනීම නාගරික සංවර්ධන අධිකාරියෙහි අරමුණ වන අතර, මෙහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ජනතා වතු සංවර්ධන මණ්ඩලය වැනි රජෙය් ඉඩම් භුක්ති විදින ආයතනයන්ට අගතියක් නොවන ආකාරයට මෙම ඉඩම් නිදහස් කරන ලෙස මහනගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක අමාත්‍යතුමා උපදෙස් ලබා දී ඇත.

ප්‍රියානි නවරත්න
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)

## නව තාක්ෂණයට අනුගත වූ නාගරික සංවර්ධන අධිකාරිය

වර්තමානය වන විට නවීන තාක්ෂණය භාවිතා කරමින් සෑම ක්ෂේත්‍රයක්ම පාහේ ඉදිරියට යමින් පවතී. එහිදී නගර නිර්මාණ ශිල්පයද ගතානුගතික ක්‍රම අතික්‍රමණය කරමින් නව තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ අනාගත නගර නිර්මාණයෙහි යෙදීම වර්තමාන ලෝකයේ ප්‍රවණතාවක් ලෙස හදුනාගත හැක.

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධානම කාර්යභාරයක් ලෙස නගර සංවර්ධන සැලසුම් සකස් කිරීම දැක්විය හැකි අතර නවීකරණය වූ තරගකාරී ලෝකය තුල සංවර්ධනය කරා ළඟා වීමට ක්‍රමවත් හා යාවත්කාලීන නගර සැලසුම් අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හදුනා ගෙන ඇත.

නාගරික සංවර්ධන අධිකාරියේ නවතම අංශයක් ලෙස පර්යේෂණ හා සංවර්ධන අංශය පිහිටුවනු ලැබුවේ ශ්‍රී ලාංකේය නගර නිර්මාණ කලාව සදහා නව ආරක් එක්කිරීමේ අභිලාශය පෙරදැරි කොට ගෙනය. පර්යේෂණ හා සංවර්ධන අංශය පිහිටුවීමේ මූලික අභිමතාර්ථය වූයේ,

- නව සැලසුම් සංකල්ප සහ තාක්ෂණයන් සොයාගැනීමත්, ඒවා නාගරික සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී කොපමණ දුරකට අදාළ කර ගත හැකිද යන්න විද්‍යානුකූලව අත්හදා බැලීමත්
- නව තාක්ෂණික හැකියාවන්ගෙන් සන්නද්ධ කාර්යමණ්ඩලයක් අධිකාරිය තුළ බිහි කිරීමත්
- නිම කරන ලද ව්‍යාපෘතින්හි අභිමතාර්ථ/ අරමුණු වෙත ළඟා වුවාදැයි අධ්‍යයනය කිරීමත්
- විවිධ තොරතුරු වලින් සමන්විත වූ දැනුම් සංකේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමත්
- විවිධ ආයතන සමග (ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය, මාර්ග සංවර්ධන අධිකාරිය) අන්තර් සම්බන්ධතා ඇතිකර ගැනීම මගින් ඵලදායි නගර සංවර්ධන සැලසුම් සකස් කිරීමත් යන පරමාර්ථයි.

මේ අනුව නව සැලසුම් සංකල්ප සහ තාක්ෂණය යොදා ගනිමින් පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් 2017 වර්ෂයේදී ලංකාව පුරා තෝරා ගත් නගර 44 ක් සදහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට තාක්ෂණික දායකත්වය සපයමින් සිටියි. මෙහිදී මෙම අංශය මගින් දැනට සිදු කරනු ලැබූ විශ්ලේෂණ හා පර්යේෂණයන්ට අනුව නගර සැලසුම් සකස් කිරීමේදී එක් එක් නගරයන්හි නාගරීකරණ දිශානතිය සහ ඉදිරි ප්‍රවණතා හදුනා ගැනීම, භූමි පරිභෝජනය (FAR) පාරිසරික සංවේදීතාව , සංවර්ධනයේ පීඩනය (Development Pressure) සහ සංවර්ධනය හේතුවෙන් වඩාත් අවධානමකට ලක්ව ඇති ප්‍රදේශ හදුනා ගැනීම වැනි අවකාශීය සංවර්ධන දර්ශක (Spatial Development Indices) විද්‍යානුකූලව සහ විශ්ලේෂණාත්මකව හදුනා ගැනීමට දායකත්වය සපයනු ලබයි. තවද භූමියේ පිහිටීම හා වෙනස්කම් හදුනා ගැනීමට නව මෙවලම් සහ ක්‍රමවේද හදුන්වා දෙමින් නව තාක්ෂණය සැලසුම් කරන ක්‍රියාවලිය සදහා එක් කොට ඇත. එහි එක් අදියරක් ලෙස ඩ්‍රෝන තාක්ෂණය යොදා ගනිමින් වඩාත් සංවේදී අවකාශීය තොරතුරු විශ්ලේෂණය කරමින් සිටී මෙවැනි අත්හදාබැලීම් සිදුකරමින් මේ වන විට පෑලියගොඩ නගර සංවර්ධන සැලැස්ම සැකසීම අවසන් කොට ඇති අතර ගාල්ල, කුරුණෑගල, ඇල්ල වැනි තෝරාගත් ප්‍රධාන නගර කිහිපයක් සදහා සෘජුවම දායකත්වය ලබා දෙමින් නගර සංවර්ධන සැළසුම් සැකසීම අවසන් කරන ලදී.

තවද පුළුල් පරාසයක පිහිටමින් නව තාක්ෂණික හැකියාවන්ගෙන් සන්නද්ධ කාර්ය මණ්ඩලයක් අධිකාරිය තුළ බිහි කිරීමේ අභිලාශය පෙරදැරි කොටගෙන පර්යේෂණ හා සංවර්ධන අංශය මගින් අධිකාරියේ නිලධාරීන් සදහා පුහුණු වැඩසටහන් මාලාවක් දියත් කරන ලදී. එහිදී නාගරික සංවර්ධන අධිකාරියේ නවමු සංකල්පයක් ලෙස පොකුරු ක්‍රමය යටතේ සංවර්ධන සැළසුම් සකස් කිරීමේ යෙදී සිටින උපායමාර්ගික සැළසුම් නිලධාරීන් 44 දෙනකු වෙනුවෙන් සිතියම්ගතකරණය හා මෘදුකාංග භාවිතයෙන් දත්ත විශ්ලේෂණය පිළිබද පුහුණු වැඩසටහන් මාලාවක් දියත් කරන ලදී.

මීට සමගාමීව නාගරික සංවර්ධන අධිකාරිය මගින් සපයනු ලබන සේවාවන් වඩා කාර්යක්ෂමව ඉටුකිරීමේ අදහසින් බලාත්මක නිලධාරීන් 120 දෙනකු බලගැන්වීම සදහා ඉඩම් අනු බෙදුම් හා ගොඩනැගිලි අයදුම්පත්‍ර පෙරසැරි කිරීම සදහා නව තාක්ෂණය උපයෝගී කර ගැනීම පිළිබඳවද පුහුණු වැඩසටහන් මාලාවක් දියත් කොට ඇත.

## නාගරික සංවර්ධන අධිකාරිය සඳහා NVIVO මෘදුකාංගය හදුන්වා දීම

උපාය මාර්ගික සැලසුම් අංශය මඟින් සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ කඩිනම් කර ගැනීම අරමුණු කර ගනිමින් ගුණාත්මක දත්ත භාවිතය උදෙසා නව තාක්ෂණික මෘදුකාංගයක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත සංවර්ධන සැලසුම් පිළියෙල කිරිම සඳහා හඳුන්වා දෙනු ලැබීය.

නාගරික සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේදි ඉතාමත් වැදගත් දත්ත එක් රැස් කිරීමක් ලෙස හඳුනා ගත හැකි සම්මුඛ පරීක්ෂණ, විවෘත සමීක්ෂණ හා ප්‍රතිචාර, විචාර ලිපි හා සමාජ ජාල ආශ්‍රිතව එකතු කරගන්නා වූ අපිළිවෙලකට පවතින ගුණාත්මක දත්ත ක්‍රමානුකූලව සකසා ගැනීමට හා විශ්ලේෂණය කිරීම පහසු කිරීමේ කාර්යය සඳහා NVIVO මෘදුකාංගය භාවිතා කල හැක.

සංස්කරණය

ව්‍යාපාර ප්‍රවර්ධන ඒකකය,
6 වන මහල, නාගරික සංවර්ධන අධිකාරිය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

www.facebook.com/uda.gov.lk
www.uda.gov.lk